වෛද්‍ය පීඨය,
රුහුණ විශ්වවිද්‍යාලය,
තැ.පෙ. 70,
කරාපිටිය,
ගාල්ල.

20........................

ස්වාමීන් වහන්ස/පූජකතුමනි/තුමියනි
මහත්මයාණෙනි/මහත්මියනි/මෙනවියනි

<u>වෛද්‍ය අධ්‍යාපන හා පර්යේෂණ කටයුතු සඳහා මෘත දේහ පරිත්‍යාග කිරීම</u>

ඔබගේ 20................දිනැති ඉල්ලීමට/දින දරණ ලිපියට බෙහෙවින් ස්තුතිවන්ත වෙමි. මරණින් මතු ඔබගේ/ඔබ වහන්සේගේ දේහය වෛද්‍ය අධ්‍යාපන හා පර්යේෂණ කටයුතු උදෙසා ප්‍රදානය කිරීමට ඔබ තුල ඇති පරමාර්ථය අතිශයින් අගය කරමි.

මරණින් මතු දේහයක අයිතිය ඥාතීන් හෝ භාරකරුවන් සතු වන බැවින් ඔබට මෙන්ම ඔවුන්ටද පහත දැක්වෙන උපදෙස් පිළිපැදීම/දැනුවත් වී තිබීම වැදගත් වනු ඇත.

1. i. මෙම ලියැවිල්ල, රුහුණ වෛද්‍ය පීඨයට මෘත දේහ භාරදීමේදී දැනගත යුතු සහ පිළිපැදිය යුතු කරුණු අඩංගු විස්තර පත්‍රිකාවක් පමණක් වන අතර, මෙය කොහෙත්ම පරිත්‍යාග කිරීමට අදාල එකඟතා ප්‍රකාශනයක්, පොරොන්දු පත්‍රයක් හෝ ගිවිසුම් පත්‍රිකාවක් හෝ නොවේ.

ii. මෙම වෛද්‍ය පීඨය, කිසිවකු හෝ සමග එබඳු කිසිදු එකඟතාවයකට ද නොඑළඹෙන බැව්ද පළමුවෙන්ම අවධාරණය කරමි.

iii.කිසිවෙකු, මරණින් මතු තම දේහය වෛද්‍ය පීඨයට පරිත්‍යාග කිරීමට කැමැත්තක් දක්වන්නේ නම් ඒ බැව් ජීවත්ව සිටියදී පීඨයට හෝ ඥාතීන්/භාරකරුවන් වෙත වාචිකව හෝ ලිඛිතව දන්වා තිබීම හෝ නොතිබීම භාරගැනීම හෝ නොගැනීමට අදාල පීඨයේ නෛතික අවශ්‍යතාවයක් නොවන්නේය.

iv. ඒ අනුව කෙනෙකු මිය ගිය පසු, දේහයේ භාරකරුවන්/ඥාතීන් විසින් ඒ බැව් වහාම පීඨයට දන්වා සිටීමෙන් පසු පහත සඳහන් විධිවිධානයන්ට යටත්ව එකී මෘත දේහ භාර ගැනීම හෝ නොගැනීම පිළිබඳව පීඨයේ තීරණය ලබාගත හැකි වනු ඇත.

2. <u>මෘත දේහ ප්‍රදානය පිළිබඳව පූර්ව දැනුම්දීම:</u>

මෘත දේහයක් ප්‍රදානය කිරීමට කැමැත්තෙන් සිටි අයෙකු මියගිය විගසම, මියගිය අය විසින් නම් කරනු ලැබූ හෝ නීත්‍යානුකූල භාරකාරිත්වයක් උසුලනු ලබන අයෙකු ඉහත සඳහන් ලිපිනයේ පිහිටි කාය ව්‍යවච්ඡේද විද්‍යා අධ්‍යයනාංශයට (Department of Anatomy) පැමිණ හෝ දුරකථනයෙන් දැනුම් දිය යුතුය.

දුරකථන අංක:

අධ්‍යයනාංශ ප්‍රධාන 0912246873

| | | |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික කාර්මික නිලධාරී | - දිගුව 192 | 0912234801, 0912234803 |
| තාක්ෂණික නිලධාරීන් | - දිගුව 185 | 0912234730, 0912234731 |

එසේ පැමිණ හෝ දුරකථනයෙන් දැනුම් දෙන අවස්ථාවේදී භාරකරු සතුව මරණයට හේතුව සඳහන් ලියවිලි සහ මිය ගිය අය පිළිබඳ තොරතුරු තිබිය යුතුය.

එහිදී භාරකරු විසින් විසින් දේහය පිළිබඳ සත්‍ය තොරතුරු අනාවරණය කළයුතු අතර ඒ මත හා පහත දැක්වෙන 6 වන වගන්තියේ උප ඡේදයන්හි සඳහන් විධිවිධාන වලට යටත්ව, කාය ව්‍යවච්ඡේද විද්‍යා අධ්‍යයනාංශ ප්‍රධානගේ

උපදෙස් පරිදි (මෘත දේහය භාර ගැනීම හෝ නොගැනීම පිළිබඳ) ගනු ලබන තීරණය සෘජුවම මෘත දේහයේ භාරකරු වෙත දැනුම් දෙනු ඇත.

මෘත දේහය භාරගනු ලබන්නේ නම් ඊට අදාල දිනය සහ වේලාව කාර්ය භාර නිලධාරියා වෙතින් භාරකරුවන් හට දැනගත හැක.

මෘත දේහය පීඨය වෙත භාරගනු ලබන සාමාන්‍ය කාල වේලාවන් වන්නේ සතියේ වැඩ කරන දිනයක (සඳුදා සිට සිකුරාදා දක්වා) පෙ.ව.10.00 හෝ ප.ව. 3.00 පමණි. රජයේ හෝ විශ්වවිද්‍යාල වල නිවාඩු දින වල සහ සති අන්ත නිවාඩු සහ පෝය දිනවල පූර්ව එකඟතාවයකින් තොරව මෘත ශරීර භාරගනු නොලැබේ.

කෙසේ වුවද භාරකරුවන්ගේ ඉල්ලීමක් සහ දෙපාර්ශවයේ පූර්ව එකඟතාවයක් මත නිවාඩු දිනකදී වුවද දේහයක් ප්‍රදානය කිරීමට කටයුතු සම්පාදනය කිරීමට ඉඩ ඇත.

එහෙත් රජය විසින් හදිසියේ පැණවිය හැකි ඇඳිරි නීති/හදිසි නීති තත්වයන්ට යටත්ව ඉහත විධිවිධාන ක්‍රියාත්මක වන බව කරුණාවෙන් සලකන්න.

3. <u>දේහය ශ්වරක්ෂණය (එම්බාම් - Embalm) කිරීම</u>

i. මරණය සිදුවී පැය 12ක් ඇතුළත දේහය භාරදීමට සහ භාරගැනීමට එකඟවී ඇත්නම්, ශ්වරක්ෂණය (එම්බාම්) කිරීම අත්‍යවශ්‍ය නොවේ.

ii. පැය 12ක කාලය ඉකුත්වී දේහය භාරදීමට සිදුවන්නේ නම් අනිවාර්යයෙන් ශ්වරක්ෂණය කළ යුතුය.

iii. දේහය ශ්වරක්ෂණය කළද මරණය සිදුවී පැය 72ක් ඉක්මයාමට පෙර පීඨයට භාරදීමට කටයුතු සලසා ගත යුතුය.

iv. කෙසේ නමුත් දේහය පීඨයට භාරදෙන අවස්ථාවේදී දේහය වියෝජනයවීමට (නරක්වීමට) භාජනය නොවී තිබීම අත්‍යවශ්‍ය කරුණකි.

v. දේහය ශ්වරක්ෂණය කරන තැනැත්තාට හෝ අවමංගල්‍ය සේවා ස්ථානයට ඒ පිළිබඳ පහත සඳහන් උපදෙස් ලබාදෙන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

a. ශ්වරක්ෂණය කළයුත්තේ පාදයක කලවා පෙදෙසේ ඉහල කොටසේ ඇති ඌර්ව ධමනිය (femoral artery) විච්ඡේදනය කිරීමෙනි. විච්ඡේදනයෙන් පසු කැපුම නිසියාකාරව මසා දැමිය යුතුය.

b. ශ්වරක්ෂණය කිරීමේදී ශරීරයේ අන් කිසිදු අවයවයක් කැපීම හෝ සිදුරු කිරීම නොකළ යුතුය. (අක්ෂිදාන සංගමයට ඇස් දන්දීමට පමණක් ඉඩ දෙනු ලැබේ).

c. ශ්වරක්ෂණය කිරීමේදී 37% ෆෝමලීන් ද්‍රාවණයකින් අවම වශයෙන් ලීටර තුනක් (03) දේහයට ඇතුලුවී මෘත දේහය පීඨයට භාරදෙන අවස්ථාව වන විට තිර (Fix) වී තිබිය යුතුය.

d. දේහය පීඨය වෙත භාරදීමේදී ශ්වරක්ෂණය (එම්බාම්) කළ තැනැත්තා හෝ ඔහුගේ නියෝජිතයෙකු අදාල කාර්ය පිළිබඳව අවශ්‍ය වෙතොත් කරුණු පැහැදිලි කිරීම පිණිස පැමිණ ඉදිරිපත් විය යුතුය.

4. <u>දේහය වෛද්‍ය පීඨයට භාරදීමේදී අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතු ලියවිලි පහත සඳහන් වේ.</u>

i. මරණය ලියාපදිංචි කිරීමේ ලේඛණයේ මුල් පිටපත් (Reg.B2) සහ පැහැදිලි ඡායා පිටපතක් (මරණ දැන්වීමේ සහතිකය (Reg.B16) හෝ ග්‍රාම නිලධාරී නිකුත් කරන මරණ වාර්තාව (Reg.B24) කිසිසේත් භාරගනු නොලැබේ).

ii. දේහය පීඨයට ප්‍රදානය කරනු ලබන භාරකරුගේ ජාතික හැඳුනුම් පත සහ එහි පැහැදිලි ඡායා පිටපතක්.

iii. මියගිය අයගේ ජාතික හැඳුනුම්පත සහ එහි පැහැදිලි ඡායා පිටපතක්.

iv. දේහය, එහි භාරකරුවන්/උරුමකරුවන් විසින් ස්වකීය කැමැත්තෙන් පීඨය වෙත පරිත්‍යාග කරන බවට වෛද්‍ය පීඨාධිපති අමතා ලියන ලද එකඟතා ප්‍රකාශනයක්.

v. මිය ගිය අය කිසියම් සැලකිය යුතු තීව්‍ර හෝ නිදන්ගත (Acute and Chronic) රෝගයකින් පෙළී සිටියේ නම් ඒ පිළිබඳව වු රෝග නිධානය/විනිශ්චය සඳහන් වෛද්‍යවරයෙකු විසින් නිකුත් කළ/නිල මුද්‍රා තැබූ ලියකියවිලි වල (Diagnosis Cards ) පිටපත්

vi. පහත 5 iv. ඡේදයේ සඳහන් රෝගයකින් හෝ ආබාධයකින් පෙළී නොසිටිය බවට තහවුරු කළ හැකි පිළිගත් ආයතනයකින් නිකුත් කළ පරීක්ෂණාගාර වාර්තා ( Laboratory reports) හෝ ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී/මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් නිකුත් කළ සහතිකයක් හෝ ලියාපදිංචි වෛද්‍යවරයකු නිකුත් කළ නිල මුද්‍රාව තැබූ සහතිකයක්.

05. <u>පහත සඳහන් ආකාරයේ මෘත දේහ වෛද්‍ය පීඨයට භාර ගනු නොලැබේ.</u>

i. මරණය ස්වාභාවික මරණයක් නොවීම

ii. උපතින්ම විකෘති වු අවයව/අඟ පසඟ පිහිටා තිබීම.

iii. කෙනෙකු මිය යාමට පෙරාතුර ගත කළ ජීවිතය තුල, හදිසි අනතුරකට භාජනය වී දැඩිලෙස තුවාලවී සිටීම හේතුවෙන් අඟ පසඟ අක්‍රමවත් වීම හෝ අවයව ඉවත්කොට තිබීම.

කිසියම් රෝගාබාධයක් හේතු කොට ගෙන ශල්‍ය කර්ම මගින් උණ්ඩුක පුච්ඡය හැරුණුකොට ඉන්ද්‍රියයන් හෝ ශරීරාංග ඉවත් කොට තිබෙන්නේ නම් ඒ පිළිබඳ තොරතුරු ඔබ විසින් මෘත ශරීරය භාරදීම පිණිස සාකච්ඡා කිරීමේදී පීඨයට දැනුම් දියයුතු වේ.

iv. කෙනෙකු මිය යන අවස්ථාවේදී හෝ ඊට දින 21කට පෙරාතුව කාලයේ,

අ. සමේ වණ, දද, කුෂ්ඨ වැනි ආසාදනයකින් පෙළී සිටීම.

ආ. පිළිකා රෝගී තත්වයකින් පෙළී සිටීම.

ඇ. එක්තැන්වීම නිසා හටගත් ඇඳ තුවාල තිබීම.

ඈ. ලිංගාශ්‍රිත සංක්‍රමණ රෝගයකින් පෙළී සිටීම. (Sexually Transmitted Diseases) (ඒඩ්ස්, හෙපටයිටිස් B සහ C , සී.එම්.වී, ක්ලැමීඩියා, උපදංශය (Syphilis) සහ සුදු බිංදුම (Gonorrhoea) වැනි

ඉ. බැක්ටීරියා, වෛරස, දිලීර හෝ පරපෝෂිත රෝග කාරක සහිත ආසාදිත රෝගයකට ගොදුරු වී සිටියේ නම් නිද. සෙංගමාලය, Septicemia (පූති රක්තතාව/ලේ විෂවීම), නියුමෝනියාව, ලාදුරු,ක්ෂය රෝගය, සරම්ප, පැපොල හා මර්ස්, සාර්ස් සහ කොවිඩ් 19 වැනි ආසාදිත රෝග

v. මිය ගිය පසුව පශ්චාත් මරණ පරීක්ෂණයක් සඳහා නිර්දේශ කොට තිබීම හෝ එය සිදු කර තිබීම.

vi. නිසියාකාරව ශ්වරක්ෂණය (එම්බාම්) කර නොතිබීම හේතුවෙන් භාරදෙන අවස්ථාව වන විට වියෝජනය (නරක්) වෙමින් පැවතීම

ඊට අමතරව මෘත දේහය සාමාන්‍ය තත්වයෙන් පැවතියද ආයතනික හේතුන්මත මෘත දේහයක් භාර නොගැනීමට ඇතැම් විට සිදුවිය හැක. කෙසේ වෙතත් මෘත දේහයක් ගැනීම පිළිබඳ අවසාන තීරණය කාය ව්‍යවච්ඡේද අධ්‍යයනාංශ ප්‍රධාන සතු බව කරුණාවෙන් සලකන්න.

6. <u>මෘත දේහයක් පීඨයට භාරදීමේදී භාරකරුවන් විසින් සිය අවධානයට ගත යුතු කරුණු</u>:

i. වෛද්‍ය පීඨය විසින් ප්‍රවාහන පහසුකම් සපයනු නොලැබේ.

ii. පැමිණෙන සියලු භවතුන් රජයේ සහ පීඨයේ සෞඛ්‍යාරක්ෂණ ප්‍රතිපත්ති වලට අනුකූලව පැමිණිය යුතු අතර එලෙස හැසිරිය ද යුතුය

iii. ඡේද අංක 4 හි සඳහන් ලියවිලි අතුරින් i. ii. iii. iv. සහ vi.ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍යය.

iv. පීඨයේදී දේහයට අවසන් වශයෙන් බුහුමන් දැක්විය හැකි නමුත් ආගමික වතාවත් ඉටු කළ නොහැකිය.

v. පීඨ පරිශ්‍රයතුල ඡායාරූප ගැනීමට අවසර නොමැත.

vi. දේහය භාරගත් විගසම පෙට්ටිය සහ ඇඳුම් ආයිත්තම් භාරුවන් වෙත නැවත භාරදෙනු ලැබේ. ඒ සඳහා අවමංගල්‍ය ආයතනයේ අයෙකු ඉදිරිපත් විය යුතුය.

vii. අදාල ලිය කියවිලි භාර ගැනීම කාර්යයේ නියුතු කාර්මික නිලධාරියා විසින් සිදු කරනු ලබන අතර, අධ්‍යයනාංශයෙන් සපයනු ලබන ප්‍රකාශනයක් පුරවා භාරකරු විසින් සිය අත්සන යොදා භාර දිය යුතුය.

viii.දේහයේ කිසිම කොටසක් කිසිවෙකුට නැවත ලබා දෙනු නොලැබේ.

ix. භාරගත් දේහයක් කිසිදු හේතුවක් නිසා නැවත දැක බලා ගැනීමට අවසර ලබා දෙනු නොලැබේ.

වෛද්‍ය අධ්‍යාපන හා පර්යේෂණ කටයුතු උදෙසා ඔබගේ/ඔබ වහන්සේගේ පරිත්‍යාගශීලී අපේක්ෂාවන් කිසිදු බාධාවකින් තොරව ඉෂ්ඨ වනු දැකීම අපගේ උදාර ප්‍රාර්ථනාව බැව් කෘතඥතා පූර්වකව සඳහන් කර සිටිමි.

ස්තුතියි.

මෙයට,

මහාචාර්ය වසන්ත දේවසිරි

පීඨාධිපති/වෛද්‍ය

17.07.2020

Dr.PMR-HOD/APPW-SSTO

PTSR